# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/42 - 2018 ජනවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2018.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 04/2018 දරන සුරාබදු නිවේදනය

**සුරාබදු නිවේදන අංක 666 හි දැක්වෙන කොන්දේසි සංශෝධනය**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 25 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මගින් 2018 ජනවාරි මස 10 දිනැති අංක 2053/26 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 02/2018 දරන සුරාබදු නිවේදනයෙන් සංශෝධිත 1979 දෙසැම්බර් මස 31 දිනැති අංක 69/5 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 666 දරන සුරාබදු නිවේදනයෙහි උපලේඛනය,

(1) 5 වැනි ඡේදයේ (v) උපඡේදය පරිච්ඡින්න කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීම,

"(v) වයස අවුරුදු 18ට අඩු පිරිමි හා කොයි වයස වුවත් ගැහැණු, එසේ වුවද, සුරාබදු කොමසාරිස් විසින් ඒ කාර්යය සඳහා විශේෂයෙන්ම අනුමත කරන ලද බලපත්‍ර ලත් ස්ථාන වල, වයසින් අවුරුදු දහඅටකට වැඩි ගැහැණු, හෝටල් සේවිකාවන් වශයෙන් පමණක් සේවයේ යෙදවීමට සුරාබදු කොමසාරිස් විසින් සිය අභිමතය පරිදි ඉඩදිය හැකිය;"

(2) 11 වන ඡේදයෙහි (ඇ) උපඡේදයට ඉක්බිතිවම එහි (ඈ) උපඡේදය වශයෙන් බලපැවැත්විය යුතු අළුත් උපඡේදය එකතු කිරීම,

"(ඈ) තැබෑරුමක් ඇතුළත දී කිසිම ස්ත්‍රියකට; හෝ"

මගින් සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

02 - 162

1A - PG 3891 — 582 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*